# 19 ධම්ම පදය I

## හැඳින්වීම :-

බුද්ධ ධර්මය පිටක වශයෙන් කොටස් තුනකට බෙදේ. එයින් සූත්‍ර පිටකයෙහි ප්‍රධාන කොටස් පහකි. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අඞ්ගුත්තර නිකාය, ඛුද්දක නිකාය, යනුවෙනි. ඛුද්දක නිකාය පොත් පසළොසකින් සමන්විත වේ. ධම්මපදය ඒ අතුරින් දෙවැන්න යි.

මුළු ත්‍රිපිටකයට අයත් සාරවත් ධර්ම කරුණු වෙන වෙන ම සැකෙවින් සරළ ව ගාථාවෙන් ගාථාවට ඇතුළත් වන බැවින් මෙම ග්‍රන්ථයට ධම්මපද යන නම ඉතාමත් උචිත වේ.

ධම්ම පදය වග්ග විසිහයකින් ( 26 ) යුක්ත ය. මුළු ග්‍රන්ථය ම සකස් වී අත්තේ ගාථාවලිනි. ගාථා සියල්ල 423 කි. බොහෝ වග්ගවල ඇතුළත් කරුණු එම වග්ගවලට දී ඇති නම්වලින් ම සිතා ගත හැකි ය. බාල, පණ්ඩිත වැනි නම් ඊට නිදසුන් ය.

බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී විවිධ ක්‍රම අනුගමනය කර ඇත. එම ලක්ෂණ රැසක් ධම්මපදයෙහි දක්නට ලැබේ. ගාථා යොදා ගැනීම හා උපමා යොදා ගැනීම එයට සාධකයන් ය. මෙහි එන උපමා සෑම අයෙකුට ම අත්දැකිය හැකි ඉතා සරල ඒවා ය. 'චක්කංව වහතො පදං' (ගොනා පසු පස යන කරත්ත රෝද මෙනි) 'දබ්බී සූපරසං යථා' (ව්‍යඤ්ජන රසය නො දන්නා හැන්ද මෙනි) 'උදකං හි නයන්ති නෙත්තිකා' (දියඇළුවෝ තමා කැමති තැනට දිය ගෙනයන්නාක් මෙනි) වැනි තැන් ඊට නිදසුන් ය. මෙ නිසා ධම්ම පදය ජන ජීවිතයට ඉතා සමීප වේ.

ප්‍රධාන වශයෙන් ධම්මපදය ධර්මෝපදේශ ග්‍රන්ථයකි. බුදුරජාණන් වහන්සේ තැන් තැන්වලදී කරන ලද දේශනාවන්හි ඇතුළත් සාරවත් ගාථා ධර්ම රාශියක් ධම්මපදයට එකතු කරගෙන ඇත. මෙහි විශේෂත්වයක් නම් නිවන් දැකීමට පමණක් නොව එදිනෙදා ජන ජීවතයේ දී මුළු මහත්

ලෝකයට ම වැදගත් උපදේශ මෙහි අන්තර්ගත වීම යි. මේ හැරුණු විට මෙහි එන හැම ගාථාවක් සම්බන්ධව ම කථාවක් ද තිබේ. එම කතා පුවත ඇතුළත් වන්නේ මෙයට ම සපයන ලද ධම්මපදට්ඨ කථා නම් වූ අටුවා ග්‍රන්ථයෙහි ය.

මෙය අතේ ගෙන යා හැකි තරම් ඉතා කුඩා පොතක් ව තිබීම තවත් විශේෂ ලක්ෂණයකි. බෞද්ධ ජනතාව ධම්මපදය අත් පොතක් ලෙස භාවිත කරති. ධර්ම දේශකයන් වහන්සේලා අතර වැඩිපුර ම භාවිත වන ග්‍රන්ථය ධම්ම පදයයි. විශේෂයෙන් නවක දේශකයන් වහන්සේලාට ධර්ම දේශනා පුහුණුවට ඉතා උචිත ග්‍රන්ථයක් ලෙස ද ධම්මපදය හා එම අටුවාව වැදගත් වේ.

ධම්ම පදයෙහි වටිනාකම තේරුම් ගත් විද්වතුන් එය ලොකයේ විවිධ භාෂාවන්ට පරිවර්තනය කර ඇත. මෙහි ඇති වග්ග විසිහය (26) අතුරින් මුල් වග්ග දෙක වන යමක හා අප්පමාද යන වග්ග දෙක මෙහි ඇතුළත් වේ.

## යමක වගගය

### 19.1 කළ කළ දේ පළ පළ දේ

සැවැත් නුවර මහා සුවණ්ණ නම් කෙළෙඹියෙක් සිටියේ ය. හේ මහා ධනවතෙකි. එහෙත් ඔහුට දරුවන් නැත. ඔහු සිටියේ ඒ ගැන කණස්සල්ලෙනි. දිනක් ඔහුට අතරමග අතුපතර ගැවසීගත් මහා නුග ගසක් මුණ ගැසිණි. එහි කිසියම් මහානුභාව සම්පන්න දෙවියෙකු අධිගෘහිතව ඇතැයි ඔහුට සිතිණ. ඒ ගස මුල හොඳින් පිරිසිදු කොට පවුරක් බැඳ, වැලි අතුරවා, ධජ පතාක ඔසවා, අලංකාර කරවූ හෙතෙම, පුතෙකු හෝ දුවක ලැබෙන්නට බාරයක් වී ගියේ ය. නොබෝ කලකින් ම ඔහුගේ බිරිඳ ගැබ්බර වූවා ය. කෙළෙඹියා ගැබ් පෙරහර කරවා සියලු සංග්‍රහ කළේ ය. දස මසක් ඇවෑමෙන් ඕ පුතෙකු වැදුවා ය. කෙළෙඹියා ද තමා පාලනය කළ වනස්පති ය නිසා ලද පුතු බැවින් ඔහුට පාල යැයි නම් තැබී ය. නොබෝ කලකින් ඇය තවත් පුතෙකු බිහි කළා ය. ඔහුට චුල්ලපාල යනුවෙන් නම් තබා වැඩිමහල්ලාට මහාපාල යැයි නම් තැබී ය. නිසි වයසට පැමිණි ඔවුහු දෙදෙන විවාහ දිවියට පත්වූහ. මෙ සමයෙහි බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාගේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක.

දෙව්රම් වෙහෙරට යන සෙනඟ පසු පස ගොස් බණ ඇසූ මහාපාලයන් කම් සැප කෙරෙහි කළකිරුණේ ය. තමන් සතු සියලු දේපළත් අඹු දරුවනුත් තම සොයුරාට පවරා දී හේ පැවිදි විය.

උන් වහන්සේ මහලු වියේදී පැවිදි වූ බැවින් බුදුරදුන්ගෙන් කමටහන් ගෙන විදර්ශනා ධුරය පුරන්නට විය.

ඉක්මනින් සිත දමනය කරනු පිණිස උන් වහන්සේගේ නේසජ්ජිකාංග ධුතංගය සමාදන් ව භාවනා වැඩී ය. ඒ ධුතාංගය සමාදන් වූ කෙනෙක් සැතපීමේ ඉරියව්වෙන් තොරව අනෙක් ඉරියව් තුනෙන් පමණක් කල් ගෙවිය යුතු ය. මේ ධුතාංගය පුරමින් මසක් පමණ නිදි වරන විට උන් වහන්සේගේ ඇසේ රෝගයක් හට ගත්තේ ය. නොයෙක් වෙදදුරන් ඇසට වෙදකම් කළ ද නිදි වැරීමත්, ඇසට බෙහෙත් උරාගන්නට සැතපෙන ඉරියව්වෙන් නොසිටීමත් නිසා රෝගය උත්සන්න විය. ඇසේ රුදුව නොතකා උන් වහන්සේ වීර්ය වැඩූහ. අන්තිමේ දී සියලු කෙලෙසුන් නසා රහත් ඵලයට පත් වූහ. ඒ සමගම උන් වහන්සේගේ ඇස් නොපෙනී ම ගියේ ය.

වැසි දිනවල සක්මන් කරන උන් වහන්සේගේ පයට පෑගෙන ගැඩවිලි, පණු ආදිහු නොදැනුවත්ව මිය යති. මේ ගැන සෙසු භික්ෂුහු බුදුරදුන්ට පැමිණිලි කළහ. මහණෙනි, රහතුන්ට මරණ චේතනාව නැතැයි උන්වහන්සේ වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා, රහත් වීමට තරමේ හේතු සම්පත් ඇති කෙනෙක් කෙසේ අන්ධ වූයේ දැයි බුදුරදුන්ගෙන් විමසා සිටියෝ ය.

'' මහණෙනි, පෙර උන්වහන්සේ දක්ෂ වෙදදුරෙකි. ඇස් රෝගයෙන් පෙළුණු එක් කාන්තාවක් ඔහු වෙත පැමිණ තමාගේ දෙනෙත් සුවපත් කළහොත් දිවි හිමියෙන් දසියක් වන්නෙමි '' යි කීවාය. ඒ පොරොන්දුව පිට හෙතෙම වෙදකම් කළේ ය. එක් බෙහෙතකින් ම රෝගය සුව අතට හැරුණි. එහෙත් වෙදදුරා ඇගෙන් සුවදුක් විමසූ විට පොරොන්දුව ඉටු කරන්නට වන නිසා රෝගය තිබුණාටත් වඩා වැඩි යැයි ඇය කීවා ය. මෙයින් කිපුණු වෙදදුරු '' ඉතිරි ටිකත් සුවපත් කරන්නෙමි '' යි කියා බෙහෙතක් දුන්නේ ය. එයින් ඇයගේ දෑස් නොපෙනී ගියේ ය. මහණෙනි, ඒ කර්මය මුන් වහන්සේ පසු පස දුක් දෙමින් ලුහු බැඳ අවුත් රහත් වන මොහොතේත් දෑස අන්ධ කළේ යැයි වදරා මේ ගාථාව දේශනා කළ සේක.

මනො පුබ්බංගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන
භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති
චක්කං ව වහතො පදං

සියලු කුසලාකුසල ධර්මයන්ට සිත මුල් වේ. සිත ප්‍රධාන වේ. ඒවා සිතින් ම උපදී. යමෙක් කිළිටි සිතින් යමක් කියයි නම් හෝ කරයි නම් එහි විපාකය ගැල ඇදගෙන යන ගොනුන්ගේ පසු පස එන රිය සක මෙන් දුක් දෙමින් ඔහු පසු පස ලුහු බැඳ එයි.

## 19.2 බුදුන් කෙරෙහි සිත පහදවා ගත් පමණින් දෙව්ලොව ගිය තරුණයා

සැවැත් නුවර ධනවත් බමුණෙක් විසීය. හේ ඉතා මසුරෙකි. කෝටි ගණන් ධනය තිබුණත් ඔහු හරි හැටි භුක්ති වින්දේ නැත. පිනකට දහමකට දෙනවා තබා නෑ හිතවතෙකුටවත් කිසිවක් දුන්නේ ද නැත. එ නිසා හේ **අදින්නපුබ්බක** යයි ප්‍රසිද්ධ විය. ඔහුට සිටියේ එකම පුතෙකි. ඔහුට රන් ආභරණයක් තැනීමට මුදල් වැයවන නිසා **අදින්නපුබ්බක** රන් කැබලි දෙකක් තමා ම තලා සිදුරු කොට පුතුගේ කණේ එල්ලී ය. එ නිසා ඔහුගේ යහලුවෝ ඔහුට **මට්ටකුණ්ඩලී** යැයි නම් පට බැන්දෝ ය.

මේ මසුරු ගෙදර දරුවාට හරි හැටි කෑම බීමක්වත් නැත. මන්දපෝෂණයෙන් දරුවාට පාණ්ඩු රෝගය වැළඳුණි. වෛද්‍යවරුන් ගෙන්වුව හොත් වියදම් වෙති' යි බියෙන් හෙතෙම වෙදුන් වෙත ගොස් රෝගය ගැන කියා ඊට දෙන බෙහෙත් අසයි. ඔහු ගැන දන්නා වෙදදුරෝ බොරු බෙහෙත් කියති. ඒවා පෙවීමෙන් දරුවාගේ රෝගය වැඩි වී මරණාසන්න විය.

දැන් මට්ටකුණ්ඩලී ඇඳේ පණ අදී. මොහු මිය ගිය හොත් ගෙදරට එන නෑ හිතවතුන් ධනය දැක දොස් කියනු ඇතැයි බිය වූ පියා පුතු ආලින්දයේ ඇඳක තබා දෙරවල් වසා දැම්මේ ය.

මහා කරුණාවෙන් ලොව බලා වදරණ බුදුරජාණන් වහන්සේට එද අසරණ මට්ටකුණ්ඩලීව පෙණුණි. උන් වහන්සේ උදෑසන ම ඒ නිවස ඉදිරිපිටට වැඩම කළහ. බිත්තියට වැටුණු අමුතු ආලෝකයක් දුටු මට්ටකුණ්ඩලී අපහසුවෙන් ඒ දෙස බැලුවේ ය. බුදුරජාණන් වහන්සේ දුටු මට්ටකුණ්ඩලීගේ සිත ශ්‍රද්ධාවෙන් පිරී ගියේ ය. වඳින්නට සැරසුණත් දෑත ඔසවන්නට පණක් නොවී ය. එකෙණෙහි ම මිය ගිය හෙතෙම දෙව් ලොව උපන්නේ ය. බුදුරජාණන් වහන්සේ වෙහෙරට වැඩියහ.

මට්ටකුණ්ඩලීගේ සිරුර සොහොනට ගෙන ගොස් දමන ලදී. තමා කළ ක්‍රියාවේ බරපතලකම පියාට දැනෙන්නේ දැන් ය. මුළු රෑ ම අදින්නපුබ්බක සොහොනට වී හඬයි, වැළපෙයි. මේ අතර තවත් තැනක කඩවසම් තරුණයෙක් වැළපෙමින් සිටියි. අදින්න පුබ්බක එතැනට ගොස් ඔහුගෙන් හඬන්නේ ඇයිදැයි විමසී ය. තමාගේ රථයට රෝද දෙකක් නැති හෙයින් අඬන බව තරුණයා කීය. දැන් අදින්න පුබ්බකගේ මසුරුකම නැත. හෙතෙම ඔහුට රනින් හෝ රිදියෙන් වුවත් රෝද තනවා දෙන්නට සූදානම් ය. එහෙත් තරුණයා ඉල්ලන්නේ ඉර හඳ දෙක ය. අදින්න පුබ්බක එය මෝඩ ඉල්ලීමකැ'යි කියා සිනා සුණේ ය. එවිට තරුණයා මා ඉල්ලන්නේ පෙනෙන දෙයකි. ඔබ ඉල්ලන්නේ නොපෙනෙන පුතෙකි. අප දෙදෙනාගෙන් වඩා මෝඩ කවුරුදැයි කීය. අදින්න පුබ්බකට කාරණය වැටහිණි. '' පුත ඔබ කවුරුදැ'යි හේ ඇසී ය. පියාණනි, ඔබේ පුතු මම ය. මම දෙව් ලොව උපන්නෙමි'යි කීය. ඒ කවර පිනකින් දැයි පියා විමසූ විට බුදුරදුන් දැක සිත පහන් කරගත් පුවත විස්තර කළේ ය. මසුරුකම පහව ගිය අදින්න පුබ්බක පසුදා බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහ දනක් පිළිගැන්වී ය. වළඳා අවසානයේ '' ස්වාමීනි වෙන කිසිදු පිනක් නොකොට තථාගතයන් වහන්සේ කෙරෙහි සිත පහදවාගත් පමණින් දෙව් ලොව ගිය අයත් සිටිත් දැ"යි බමුණා විමසී ය. 'ඇයි බමුණ ! ඒ අන් කවරෙකුවත් නොව ඔබේ ම පුතු මට්ටකුණ්ඩලී නොවේදැ'යි වදරා, මේ ගාථාව දේශනා කළ සේක.

මනො පුබ්බංගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන
භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති
ඡායාව අනපායිනී

සියලු කුසලාකුසල ධර්මයන්ට සිත පෙරටු වේ. සිත ප්‍රධාන වේ. ඒවා සිතින් ම උපදී. පිවිතුරු සිතින් යමක් කියයි නම් හෝ කරයි නම් එහි විපාකය අත් නොහැර බොහොම සැහැල්ලුවෙන් තමා පසු පස එන සෙවනැල්ල මෙන් ගෙන දෙමින් ලුහු බැඳ එයි.

## 19.3 උඩගුකමින් දූපී සිටි ථුල්ල තිස්ස තෙරුණුවෝ

තිස්ස තෙරුණුවෝ බුදුරදුන්ගේ සහලේ නෑයෙකි. සුද්ධෝදන රජතුමාගේ නැගණියගේ පුතු ය. තරමක් මහලු වියේ පැවිදි වූ උන් වහන්සේ බණ දහම් ඉගෙනීමට හෝ බණ භාවනා කිරීමට උනන්දු නොවී ය. බුදුරදුන්ට ලැබෙන මිහිරි දේ වළඳා පුෂ්ටිමත් වූ සිරුරු ඇතිව නිතර උටැන්හලෙහි ම කල් ගෙවයි. එනිසා ම උන්වහන්සේට ථුල්ලතිස්ස යැයි නමක් පටබැඳුණි.

බුදුරදුන්ගේ නෑකම හිතට ගත් උන් වහන්සේ උවටැන් හලෙහි මහ අසුනක වැඩ හිඳී. වැඩි මහලු තෙරවරු පැමිණියත් හුනස්නෙන් නො නැගිටියි. වතාවත් ආදී කිසිවක් නොකරයි. වැඩිහිටි තෙරවරු පවා මහතෙර නමකැයි සිතා උන් වහන්සේට වැඳුම් පිදුම් කරති. තිස්ස තෙරුණුවෝ උඩගුකම නිසා ඒ සියල්ල නිහඬ ව ඉවසති.

දිනක් ආගන්තුක හිමි නමක් උන්වහන්සේගේ වස් ගණන විචාළේ ය. එයින් උන්වහන්සේ අළුත පැවිදි වූ කෙනෙකු බව දැනගත් භික්ෂූන් වහන්සේලා මෙතරම් බාල කෙනෙක් මහ තෙරවරුන්ගෙන් වැඳුම් පිදුම් ලබන්නේ කුමන නිර්ලජ්ජිකම නිසා දැයි චෝදනා කළහ. එයින් මහත් සේ කිපුණු ථුල්ලතිස්ස තෙරුණුවෝ බුදුරදුන් වෙත හඬාගෙන ගොස් එය පැමිණිලි කළ හ. එවිට

බුදුරජාණන් වහන්සේ තිස්ස ඔබ සිටියේ කොහි ද? ස්වාමීනි, වෙහෙර මැද උපස්ථාන ශාලාවෙහි ය. මේ භික්ෂූන් වඩිනවා දුටුවා ද? එසේය ස්වාමීනි' ඔබ පෙර ගමන් කළා ද? පා සිවුරු පිළිගත්තා ද? පා දෝනා පැන් තැබුවා ද? අසුන් පැනෙව්වා ද? '' තිස්ස තෙරුන් ඒ සියල්ලට ම නැතැයි කීය. '' තිස්ස වැඩි මහලු භික්ෂූන්ට වැඳ මේ සියලු දේ කළ යුතු යි. එසේ නොකරන්නෙකු වෙහෙර මැද නොසිටිය යුතු යි. වරද ඔබේ ය. මේ භික්ෂූන්ට වැඳ සමාව ගන්නැ'' යි වදළ හ. '' ස්වාමීනි, මොවුන් මට බැන්නා. මම සමාව නොග නිමි මොවුන් මගෙන් සමාව ගත යුතුය'යි '' තිස්ස තෙරණුවෝ වදාළ හ. උන්වහන්සේ බුදු වදනට වත් නැමුණේ නැත. ස්වාමීනි, මේ තිස්ස තෙරුන් අකීකරු නොවේදැයි අනෙක් භික්ෂූහු පැවසූ හ. එවිට බුදුරජාණන් වහන්සේ '' මහණෙනි, මොහු අකීකරු වූයේ අද පමණක් නොවේ '' යයි පෙර දේවල තාපසයන් වූ බෝසතාණන් වහන්සේට නාරද තාපසව සිටි තිස්ස තෙරුන් අකීකරු වූ පුවත වදරා තිස්ස තෙරුන්ට අවවාද කරමින් මේ ගාථා දෙකින් දහම් දෙසූ හ.

අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යෙතං උපනය්හන්ති
වෙරං තෙසං න සම්මති

අසවලා මට බැන්නේ ය. අසවලා මට ගැසුවේ ය. අසවලා මා පරදවා ජය ගත්තේ ය. අසවලා මා සතු දේ පැහැර ගත්තේ ය. යනුවෙන් සිතමින් වෛර බඳින්නන්ගේ වෛරය කිසිදු නො සංසිඳේ.

අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යෙතං උපනය්හන්ති
වෙරං තෙසූපසම්මති

අසවලා මට බැන්නේ ය. අසවලා මට ගැසුවේ ය. අසවලා මා පරදවා ජය ගත්තේ ය. අසවලා මා සතු දේ පැහැර ගත්තේ ය. යනුවෙන් නොසිතන වෛර නොබඳින්නාගේ වෛරය සංසිඳේ.

උපනයඝාන්ති - '' බද්ධවෙරමුපනාහෝ '' උප නාහය යනු බද්ධ
වෛරය යි. නැවත නැවත වෛර බැඳීම යි.

## 19.4 වෛරයෙන් වෛරය නොසන්සිඳේ

එක්තරා තරුණයෙක් තම පියා මළ පසු කුඹුරු වැඩත්, ගෙදර වැඩත්, කරමින් මවට ද උවටැන් කරමින් වාසය කළේ ය. පුතු විඳින වෙහෙස දුටු මැණියෝ ඔහුට ආවාහයක් කර දෙන්නට කල්පනා කළා ය. මුලදී එයට අකැමැති වූ තරුණයා මවගේ පෙරැත්තය නිසා ම අන්තිමේදී එකඟ විය. නිසි සිරිත් විරිත් ඉටු කර ගෙදරට කුමරියක් කැන්දගෙන එන ලදී.

කලක් ගත විය. ඇය දරුවන් නැති වඳ ගැහැණියකි. පුතෙකු නැතිව කුලය වැනසේ යැයි සිතූ මව තවත් කුමරියක ගෙන එන්නට යෝජනා කළා ය. පුතු අකමැති විය. එවිට පළමු බිරිය ම ඉදිරිපත් වී ඔහුට කුමරියක කැන්ද දුන්නා ය. දෙවන බිරියට දරුවකු ලැබෙන සලකුණු පහළ විය. දරුවා ලැබුණු විට සියලු ධනය ඇයට හිමිවේය යන බිය නිසා පළමු බිරියට ඊර්ෂ්‍යාව ඇති විය. තම යෙහෙළියට කැඳ බත් දී සලකන මුවාවෙන් බෙහෙතක් දී ඇය ගබ්සා කළා ය. මෙසේ දෙවරක් ම සිදු විය. තුන්වන වර ඇය තමා ගැබ්බර බව සඟවාගෙන සිටියා ය. ගැබ මෝරා ගියේ ය. පළමු තැනැත්තියට ඉවසුම් නැති විය. තමාට ඒ ගැන නොකීම ගැන බැණ වැදුණු ඇ එවර ද ගැබ නසන්නට බෙහෙතක් බලහත්කාරයෙන් ම පෙව්වාය. ගැබ මෝරා ගිය හෙයින් හරස් වී, මව ද මරණාසන්න වූවා ය. එහි දී කෝපයෙන් වියරු වූ ඇය "මගේ දරුවන් තිදෙනෙකු නසා දූමූ තිගේ දරුවන් යකිනියක වී කා දමමි" යි කියා වෛරයෙන් ම මිය ගියා ය.

ඇය මිය ගොස් ඒ නිවසෙහි ම බැළලියක වී උපන්නා ය. සිද්ධියෙන් කෝපයට පත් සැමියා ගැසූ පහරින් අනෙක් ස්ත්‍රිය මිය ගොස් එහි ම කිකිළියක වී උපන්නා ය. පතා ගෙන ආ පරිදි ම කිකිළිය දමන දමන බිත්තර බැළලිය කා දමයි. මෙයින් වෛර බැඳගත් කිකිළිය මමත් නුඹේ දරුවන් කන්නෙමි'යි

වෛරයෙන් ම මිය ගොස් කොටි දෙනක වී උපන්නා ය. බැළලිය ඒ වනයෙහි ම මුව දෙනක ව උපන්නා ය.

මුව දෙන වදන වදන පැටියා කොටි දෙන අවුත් කා දමයි. එයින් වෛර බැඳගත් මුව දෙන 'මමත් නුඹේ දරුවන් කා දමන්නෙමි' යි වෛරයෙන් මිය ගොස් අප බුදුන් දවස සැවැත් නුවර යකිනියක ව උපන්නා ය. අනෙක් තැනැත්තිය පරණ පිනකින් එනුවර කුල දුවක ව උපන්නා ය. කුල දුව දරුවෙකු බිහි කළ විට යකිනිය යෙහෙළියක ගේ වේශයෙන් අවුත් සුරතල් කරන මුවාවෙන් දරුවා වඩාගෙන කා දමයි. මෙසේ දෙවරක් ම සිදු විය.

තුන්වෙනි වර කුල දුව මව්පියන් වෙත ගොස් එහිදී දරුවා බිහි කළා ය. යකිනිය ඈය සොයා එහෙ මෙහෙ දුවන්නට විය. දරුවා ද රැගෙන ආපසු එන දෙමහල්ලන් නාන පොකුණක් ළඟ සිටිය දී හදිසියෙන් ම යකිනියට මුණ ගැසිණ. බියපත් ස්ත්‍රිය දරුවා රැගෙන දුවන්නට වූවා ය. යකිනිය ඈ පසු පස ලුහු බඳියි. ස්ත්‍රිය දරුවා රැගෙන දිගට ම ගියේ දෙව්රම් වෙහෙර තුළට ය. දෙවියන්ගේ ආරක්ෂාව නිසා ඇතුළට යා නොහැකි ව යකිනිය දොරටුව අසල නැවතුණා ය. කුල දුව දරුවා බුදු පා මුල තබා හඬමින් තම දුක් ගැනවිල්ල කියා සිටියා ය. ඒ මොහොතේ අනඳ තෙරුන් යවා යකිනිය කැඳවූ බුදුරජාණන් වහන්සේ '' ඔබ මෙසේ කරන්නේ ඇයි? අද බුදු කෙනෙකුන් හමු නොවුණා නම් වලස් කොළොම් දබරය මෙන් ද කපුටු බකමූහුණු වෛරය මෙන් ද කප තිබෙන තුරු මේ වෛරය නොසංසිඳන්නේ යැයි වදරා මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

නහි වෙරෙන වෙරානි
සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්තී
එස ධම්මො සනන්තනො

මෙ ලොව කිසි කලෙකත් වෛරයෙන් වෛරය නොසන්සිඳේ. වෛරය අවෛරය හෙවත් මෛත්‍රියෙන් ම සන්සිඳේ. මෙය පෙර සිට පැවත එන සදාකාලික දහමකි.

මේ දේශනාව අවසානයේ යකිනිය සෝවාන් පලයෙහි පිහිටියා ය. ඉන්පසු බුදුරදුන්ගේ අනුමැතියෙන් දරුවා අතට ගෙන සිප වැළඳ ගෙන ආපසු මවට දුන්නා ය. එහෙත් මෙතැන් සිට ප්‍රාණඝාත නොකරන තමාට අහර ලබන්නට ක්‍රමයක් නැති හෙයින් යකිනිය හඬන්නට වූවා ය. එවිට බුදුරජාණන් වහන්සේ ඇය කැඳවා ගෙන ගොස් පෝෂණය කරන්නට කුල දුවට ම භාර කළා ය. දුන් ඇය ගෙය පිටුපස මඩුවක යකිනිය නවත්වාගෙන සලකයි. එහෙත් කුස්සියේ පිටි කොටන, මෝල් හඬ යකිනියට ඉවසිය නොහැක. ඇය ඒ බව යෙහෙළියට කීවා ය. ක්‍රමයෙන් ගෙයින් තරමක් ඈත තැන් තැන්වල නවත්වන ලදී. ළමයින්ගෙන් බල්ලන්ගෙන් ඉඳුල්වලින් කසලවලින් වන හිරිහැර නිසා ඇයට කිසි තැනක සිටිය නොහැකි විය. අන්තිමේදී ගමෙන් පිටත තැනක් පිළියෙල කොට යකිනිය එහි නවත්වා නිතිපතා ආහාර පාන ලබා දෙන ලදී. එහිදී යකිනිය යෙහෙළියට ගොවිතැන් ආදිය පිළිබඳ නොයෙක් අනාවැකි කියයි. කුළ දුව ඒ ගැන ගැමියන් ට කියා විපත්වලින් ගම ගලවා ගනී. සම්පත් උදා කර දේ. මේ තොරතුරු දන්නේ කෙසේදැයි මිනිස්සු කුල දුවගෙන් විමසූහ. අසවල් තැන සිටින යක්ෂණිය අනාවැකි කියන්නී ය. ඔබත් ආහාර පාන ගෙන ගොස් දුන්නොත් ඔබට ද උපකාර කරනු ඇතැයි ඇය කීවා ය. එතැන් පටන් ඒ නුවර වැසියෝ ඇයට සත්කාර කරන්නට පටන් ගත්තෝ ය. යකිනිය ඔවුන්ට උපකාර කළා ය. අද දක්වාත් ඕ ඒ සත්කාර ලබමින් ජනයාට උපකාර කරන්නී ය.

## 19.5 කොසඹෑ නුවර විනය කෝලහලය

කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි පන්සියයක් පිරිවර ඇති ප්‍රසිද්ධ විනයධර භික්ෂූන් වහන්සේ නමක් ද පන්සියයක් පිරිවර ඇති ප්‍රසිද්ධ ධර්ම කථිකයන් වහන්සේ නමක් ද විසූ හ. මෙයින් ධර්ම කථික තෙරුන් වහන්සේ දිනක් වැසිකිළි බඳුනෙහි ජලය ටිකක් ඉතිරිකොට නික්ම ගොස් තිබුණි. විනයධර භික්ෂූන් වහන්සේ උන්වහන්සේට වරද පෙන් වූහ. එවිට ධර්ම කථික තෙර තමා වරද නොදන්නා බවත් පිළියම් කිරීමට කැමති බවත් කීය. නොදැන කළ හෙයින් ඇවැතක් නැතැයි විනයධර තෙරණුවෝ කීහ. ධර්ම කථික තෙර එතෙකින් එය අමතක කර දැමී ය.

එහෙත් විනයධර තෙර නම "ධර්ම කථිකයන් වහන්සේ තමාට ඇවතක් සිදු වී තිබියදීත් එය නොදනිතියි", තමන් වහන්සේගේ පිරිසට කියමින් උපහාස

කළහ. එවිට ධර්ම කථිකයන් වහන්සේ "විනයධර තෙර නම මුසාවාදියෙකි. මුලදී වරද නැතැයි කියා දැන් වැරදි යැයි කියති"යි පෙරළා චෝදනා කළහ.

මෙසේ දෙපිරිස අතර විවාදය වැඩි වී ගියේ ය. අනතුරු ව විනයධරයෝ ධර්ම කථික හිමියන්ට වරද නොදැකීම පිළිබඳ ව **උක්ඛේපනීය කර්මය** කළහ. එයින් තත්ත්වය තවත් උග්‍ර විය. එතැන් පටන් ඒ ඒ භික්ෂු පිරිසට පක්ෂ දයකයෝ ද, උපස්ථායකයෝ ද, භික්ෂුණියෝ ද, දේවතාවෝ ද යනා දී සෑම තලයක ම අය දෙපක්ෂයට බෙදී ගියහ. අකනිටා බඹලොව දක්වා මේ කෝලාහලය ප්‍රසිද්ධව ගියේ ය. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට සමගි වන ලෙස දෙවරක් ම දන්වා යැවූ නමුත් කිසිවෙක් ඊට අවනත නොවූහ. අනතුරුව උන්වහන්සේ එතැනට වැඩමවා සමගියේ අනුහස් පෙන්වා දෙමින් **ලටුකික ජාතකය** වදාළ සේක. එයත් නොපිළිගත් විට **දීඝීති කෝසල ජාතකය** ද දේශනා කළහ. එයින් ද විවාදය නොසන්සිඳුණි.

එවිට බුදුරජාණන් වහන්සේ 'මේ භික්ෂුහු මගේ වචනය නොපිළි ගනිති. මා මොවුන්ගෙන් වෙන් ව හුදකලාව විසුව මැනව'යි. තනිව ම පා සිවුරු ගෙන පාරිලෙය්‍ය වනයට වැඩම කොට එහි වස් විසූහ. ඒ තුන්මස පාරිලෙය්‍යක ඇතා බුදුරදුන්ට උපස්ථාන කළේ ය. බුදුරදුන්ටත් අවනත නොවීම නිසා භික්ෂු පිරිස ගැන කළකිරුණු කොසඹෑ නුවර ජනයා ඔවුන්ට සිවුපසය දීමත් ඔවුන් සමග කතා කිරීමත් නතර කර දැමූහ.

අවසානයේ දී භික්ෂුන් වහන්සේලා වරද පිළිගෙන සමගි වූහ. එහෙත් බුදුරජාණන් වහන්සේගෙන් සමාව ගන්නා තුරු මහජනයා තම තීරණය වෙනස් නොකළහ. අනතුරු ව අනඳ තෙරණුවෝ වෙනත් භික්ෂුන් වහන්සේලා පන්සියයක් සමග පාරිලෙය්‍ය වනයට ගොස් භික්ෂූන් නවතා, තනිව බුදුරදුන් හමුවීමට ගියේ ය.

එවිට පාරිලෙය්‍යය ඇතු දණ්ඩක් ගෙන පහර දීමට පැන්නේ ය. බුදුරජාණන් වහන්සේ ඔහු වළකාලී ය. පසුව පන්සියයක් භික්ෂූහු ද එහි වැඩිය හ. පසු ද ඇතාගේ කැමැත්ත පරිදි උන්වහන්සේලාට දවසක් වනයේ ගත කරන්නට සිදු විය. පාරිලෙය්‍යක ඇතා බුද්ධ ප්‍රමුඛ සංඝයාට පලතුරු වලින් දනය සැපයී ය. අනඳ හිමියන්ගේ ඇරයුම පිළිගෙන බුදුරජාණන් වහන්සේ ආපසු ඒමට පිටත් වූහ. පෙරළා වඩින විට පසු පසින් ම හඬ හඬා පැමිණි පාරිලෙය්‍යක ඇතා ගම් මායිම අසල දී බුදුරජාණන් වහන්සේ විසින්

නවතන ලදී. බුදුරදුන් පේන තෙක් මානයෙන් ඉවත්වන තුරු ම සංවේගයෙන් බලාසිටි ඇත් රජු හද පැලී මිය ගොස් තව්තිසා දෙව්ලොව පාරිලෙයාක දිව්‍ය පුත්‍රව උපන්නේ ය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් පිරිවරා දෙව්රම් වෙහෙරට වැඩම කළ සේක.

මේ අතර කොසඹෑ නුවර භික්ෂූහු බුදුරජාණන් වහන්සේගෙන් සමාව ගැනීමට සැවැත් නුවර බලා පිටත් වූහ. සිද්ධිය සැළ වී කොසොල් රජතුමා ඒ භික්ෂූන්ට විජිතයට ඇතුල් වීමට ඉඩ නොදෙන්නට සැරසුණේ ය. අනේපිඬු සිටුතුමා ද දෙව්රම් වෙහෙරට පිවිසීම ද වළක්වාලන්නට සූදනම් විය. බුදුරජාණන් වහන්සේ කරුණු කියා දෙදෙනා ම වැළකූහ. භික්ෂු පිරිස බිම බලා ගෙන ම මහත් ලැජ්ජාවෙන් පැමිණ බුදුරදුන් සමා කරවා ගත්හ. ඒ මොහොතේ ඔවුන් කළ වරදෙහි බරපතලකම පෙන්වා දෙමින් බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

පරෙ ච න විජානන්ති
මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති
තතො සම්මන්ති මෙධගා

කෝලාහල කරන සමහර කෙනෙක් මෙයින් අප නැසෙනු ඇත.
වැනසෙනු ඇතැයි කියා හෝ නොදනිති. යම් කෙනෙක් ඒ බව දනිත් නම්
එයින් ඔවුන්ගේ කළහයෝ සන්සිඳෙති.

## 19.6 මහණකමෙහි කලකිරවන සුබ දසුන්

දඹදිව සේතව්‍ය නුවර **චූලකාල**, **මජ්ඣිම කාල**, **මහා කාල**, යයි වෙළඳ පුත්‍රයෝ තිදෙනෙක් විසූහ. එයින් වැඩි මහලු සහ බාල සොහොයුරෝ දෙදෙන තැන තැන ගොස් වෙළඳ බඩු රැස් කරගෙන එති. මජ්ඣිම කාල ඒ බඩු විකුණයි.

වරක් චූලකාල සහ මහකාල දෙදෙනා වෙළඳ බඩු සොයා සැවැත් නුවර ගියෝ ය. සවස් යාමයෙහි ගැල් මුදහැර සිටින අතර මහාකාලට දෙව්රම් වෙහෙරට යන පිරිසක් මුණ ගැසුණි. ඔවුන් බුදුරදුන්ගෙන් බණ ඇසීමට යන බව දැන ගත් මහාකාල ඔවුන් සමග ගොස් බුදුන් වැඳ පිරිස කෙළවර හුන්නේ ය.

බුදුරජාණන් වහන්සේ මහාකාලගේ පින් මහිමය දැක ඔහුට සරිලන දහමක් ම දෙසූහ. දේශනාව අවසානයෙහි කම් සැපයෙහි කලකිරුණු හෙතෙම බුදුරදුන් හමු වී පැවිදි වන්නට අවසර ඉල්ලීය. අවශ්‍ය ඥාතීන්ගෙන් අවසර ගෙන එන්නැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. බාල සොහොයුරා වෙත ගිය මහාකාල ගැල් බඩු, ගේ දෙර ඇතුලු සියලු සම්පත් ඔහුට බාරකොට ඔහුගේ බලවත් ඇවිටිලි ද නොතකා බුදුරදුන් වෙත ගොස් පැවිදි විය. සොහොයුරා කෙසේ හෝ සිවුරු හරවාගෙන එන්නෙමියි සිතා ඒ පසුපස ම ගිය චූලකාල ද පැවිදි විය.

මහාකාල තෙරණුවෝ මහලු ව පැවිදි වූ හෙයින් විදර්ශනා ධූරය පුරන්නට විය. **සෝසානික ධුතාංගය** සමාදන් වී රාත්‍රී යාමයෙහි සොහොනෙහි හිඳ බවුන් වැඩූ උන්වහන්සේ විදර්ශනා වඩා රහත් වූහ. පෙරළා ගිහිගෙට යන්නට සිටි චූලකාල තෙරණුවෝ ගේ, දෙර අඹු දරුවන් ගැන ම සිතමින් කල් ගෙවී ය.

මේ අවදියේ බුදුරජාණන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙමින් සේතව්‍ය නගරයට වැඩම කළහ. චූලකාල තෙරුන්ගේ භාර්යාවෝ උන්වහන්සේ ගෙදරට ගෙන්වා සිවුරු හරවා ගන්නා අදහසින් බුද්ධ ප්‍රමුඛ සංඝයාට දනට ඇරයුම් කළෝය. එහි අසුන් පැණවීමට කල් ඇතිව යවන ලද්දේ චූලකාල තෙරණුවන් ය. එහිදී උන් වහන්සේ වටා රොක් වූ භාර්යාවෝ උසුළු විසුළු කොට උන් වහන්සේ බලහත්කාරයෙන් සිවුරු හරවා සුදුවත් හඳවා බුදුරදුන් වැඩමවාගෙන ඒමට යැවූහ.

බුද්ධ ප්‍රමුඛ සංඝයා නිවසට වැඩ දන් වළඳා අවසානයේ දී මහාකාල තෙරුන්ගේ පළමු බිරියෝ ද උන්වහන්සේ සිවුරු හරවා ගන්නා අදහසින් භුක්තානුමෝදනාව සඳහා මහාකාල තෙරුන් නවතා වඩින ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියහ. උන්වහන්සේ ද ඊට ඉඩ දී සංඝයා සමග වෙහෙරට වැඩි සේක. වෙහෙරට වැඩ දම් සභාවේ වැඩසිටි භික්ෂූන් වහන්සේලා කතා කළේ චූලකාල හිමියන්ට සිදු වූ දේ දැන දැනත් තථාගතයන් වහන්සේ මහාකාල තෙරුන් නවතා ඒම ගැන ය.

දම් සභාවට වැඩි බුදුරජාණන් වහන්සේ උන් වහන්සේලාගේ අදහස දැන '' මහණෙනි! එසේ නොසිතන්න. චූලකාල භික්ෂුව කඳු පාමුලක ඇති දුබල රුකක් වැනි ය. රූපාදී අරමුණු සුභ ලෙස දකියි, පහසුවෙන් කෙළෙස් සුළඟින් ගසාගෙන යා හැකි කෙනෙකි. එහෙත් රූපාදී අරමුණුවල අසුභ පැත්ත දකින මහාකාල ගල් පර්වතයක් වැනි ය. දැන් කිසිදු සැඩ සුළඟකින් නොසැළේ යයි වදළහ.

මේ අතර මහාකාළ තෙරුන්ගේ පුරාණ බිරියෝ '' ඔබ කාගෙන් අසා පැවිදි වූයෙහි ද ? දැන් ගිහි වෙනවා නොවේද'' යි කියමින් උන් වහන්සේ වට කරගෙන සිවුරු හරවා ගන්නට තැත් කළහ. උන් වහන්සේ සෘද්ධියෙන් ඔවුන්ගෙන් ගැලවී මැදුරෙහි කැණි මඩල පලාගෙන අහසට පැන නැංගාහ. දම් සභා මණ්ඩපය මැද පහළ වූ උන්වහන්සේ බුදුරදුන් වැඳ එකත්පස් ව හුන්හ. ඒ මොහොතේ බුදුරජාණන් වහන්සේ පහත සඳහන් ගාථා වලින් දහම් දෙසූහ.

සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීන වීරියං
තං වෙ පසහතී මාරො - වාතො රුක්ඛං ව දුබ්බලං

රූපාදී අරමුණු සුභ ලෙසින් බලන, පසිඳුරන් සංවර කර නොගත්, ආහරයෙහි පමණ නොදන්නා, කුසීත වූ, වීර්යය අඩු වී ගිය පුද්ගලයා, දුබල රුකක් සුළඟින් බිඳ වැටෙන්නා සේ මැරි මැරී උපදින්නෙක් වන්නේ ය.

අසුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං - සද්ධං ආරද්ධ වීරියං
තං වෙ නප්පසහතී මාරො - වාතො සෙලං ව පබ්බතං

රූපාදි අරමුණු අසුභ ලෙස දකින, මැනවින් ඉඳුරන් දමනය කරගත් ආහාරයෙහි පමණ දන්නා, සැදැහැති, පටන් ගත් වීර්යය ඇති තැනැත්තා, සුළඟින් නොසැලෙන පර්වතයක් සේ නැවත මරණයට ගොදුරු නොවන්නෙක් වේ.